**ශීර්ෂය 101 - බුද්ධශාසන අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශනය, බුද්ධශාසන අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම හා සැසඳුම් ප්‍රකාශයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියලුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියලු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

ශීර්ෂය 101 - බුද්ධශාසන අමාත්‍යාංශයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය,අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීතිරීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

----------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බුද්ධශාසන අමාත්‍යාංශයේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.3 ඡේදයේ සිට 2.10 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හි සඳහන් විධිවිධානඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 127 ප්‍රකාර ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| ------------------------ | ------------------------ | ------------------------------------ | ------------------ |
| මුදල් රෙගුලාසි<br>-------------------- | | | |
| 127(1)(ආ) | වියදම් සහ රාජ්‍ය ආදායම් එකතු කිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලැසෙන ක්‍රමයක් සම්පාදනය කළ යුතුවීම. | 1. අවිධිමත් ගනුදෙනු | 2.3 |
| | | 2. කළමනාකරණ අඩුපාඩු | 2.5 |
| | | 3. විසදා නොතිබුණු විගණන ඡේද | 2.4 |
| | | 4. අනුකුල නොවීම් | 2.9 |
| | | 5. මානව සම්පත් කළමනාකරණයේ අඩුපාඩු | 2.10 |
| 127(3) | ස්වකීය පරිපාලනාත්මක කෘතහස්තතාව හා විචාර බුද්ධිය මෙහෙයවා සුදුසු පරිදි ක්‍රියා කළ හැකි වන පිණිස සැකැයක් හෝ උද්ගත වී ඇති සියලු ප්‍රශ්න තමා වෙත ඉදිරිපත් වෙන ආකාරයක් සලසා තිබීම. | 1. වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව | 2.2(ඇ) |
| | | 2. පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම | 2.2(ඈ) |
| | | 3. මහජනයා සඳහා සේවා ඉටු කිරීමේ දුර්වලතා | 2.5(ඉ) |
| | | 4. වත්කම් ලේඛන ගත නොකිරීම | 2.2 (අ) |
| | | 5. වාහන ඉන්ධන දහනය පරීක්ෂා නොකිරීම් | 2.2(ආ) |

| | | | |
|---|---|---|---|
| 127(4) | තමාගේ එක් එක් ගණන්දීමේ නිලධාරියා විසින් විසර්ජන ගිණුම් විධිවූ පරිදි ඉදිරිපත් කරන බවට හා තමා ඒවා අත්සන් කිරීමට පෙර අමාත්‍යාංශයේදී පරීක්ෂා කරනු ලබන බවටත්, එසේම ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල සහ තථ්‍ය වියදම අතර පවත්නා සැලැකිය යුතු වෙනස්කම් තමා විසින්ම, දැඩි ලෙස විමර්ශනයට භාජනය කිරීම. | 1. පොදු තැන්පත් ගිණුම්වල අඩුපාඩු<br>2. බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු | 2.7<br>2.8 |
| 127(5) | දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල හා වියදම අතර ඇති සැලැකිය යුතු වෙනස්වීම් අමාත්‍යාංශයේ දැඩි ලෙස පරීක්ෂණයට භාජනය කෙරෙන බව | 1. සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම<br>2. අධි ප්‍රතිපාදන සලසා තිබීම<br>3. පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් ලබාගත් ප්‍රතිපාදන උපයෝජනය කිරීමේ අඩුපාඩු | 2.6(i)<br>2.6(ii)<br>2.6(iii) |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 2.1 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබා ගැනීම

අමාත්‍යාංශය විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කරමින් සැපයීම් හා සේවා ලබා ගත යුතු වු රු. මිලියන 29.46 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 28.88 ක ප්‍රතිපාදන පමණක් උපයෝජනය කර තිබුණි.

### 2.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) වත්කම් ලේඛනගත නොකිරිම**

අමාත්‍යාංශය යටතේ පවතින කුරුන්දන්කුලම රජරට චාරිකා නිවාසය හා එය පිහිටා ඇති ඉඩම තක්සේරු කර ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කර නොතිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි 3.1 ඡේදය ප්‍රකාර සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසුව මාස 12 ක කාල සීමාවකින්ම හෝ කිලෝමීටර් 25000 ක් දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවකට පසුව යන කාරණා අතුරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවත්, අමාත්‍යාංශයේ වාහන සඳහා ඉන්ධන පරීක්ෂාව සිදුකර නොතිබුණි.

**(ඇ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

තිරසර සංවර්ධන වනජීවී අමාත්‍යාංශයේ වාහනයක්, යටිතල පහසුකම් සංවර්ධන, ධීවර හා නිවාස අමාත්‍යාංශය සතු වාහනයක් හා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ වාහන 2 ක් වශයෙන් වාහන 4 ක් බුද්ධශාසන අමාත්‍යාංශය විසින් පරිහරණය කරනු ලබන අතර මෙම වාහන අමාත්‍යාංශය පවරා ගෙන නොතිබුණි.මින් එක් වාහනයක් ධාවනය කළ නොහැකි තත්ත්වයේ පැවතුණි.

**(ඈ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට අයත් ඉඩමක අමාත්‍යාංශය විසින් 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා රු.මිලියන 32 ක් වැයකර දහම් පාසල් ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණද මෙම ඉඩම 2018 සැප්තැම්බර් 30 දින දක්වා පවරා ගෙන නොතිබුණි. එසේම ඉදිකළ ගොඩනැගිල්ලේ යතුරු අමාත්‍යාංශය හෝ අදාළ දහම් පාසල සතුව නොමැති වීම හේතුවෙන් ගොඩනැගිල්ල අවභාවිතව පැවතුණි.

## 2.3 අවිධිමත් ගනුදෙනු

අමාත්‍යාංශය එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොරවිය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථාවක් පහත දැක්වේ.

**අති පූජ්‍ය මහානායක ස්වාමීන් වහන්සේලා සඳහා වාහන ලබාදීම**

2017 වර්ෂයේදී මුදල් අමාත්‍යාංශය වෙතින් භාරගත් වාහන හතරක්, බුද්ධශාසන අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කර, අති පූජ්‍ය මහානායක ස්වාමීන් වහන්සේලා වෙත ලබා දී තිබුණි. එහෙත්ට අමතරව ඒ වන විටත් මිලදී ගෙන තිබූ වාහනයක් සඳහා ස්වාමීන් වහන්සේ නමක් වෙත රු.මිලියන 25 ක මුදලක් ලබා දී තිබුණු නමුත් එම අදාළ වාහනය අමාත්‍යාංශය නමට ලියාපදිංචි කර නොතිබුණි.

## 2.4 විසඳා නොතිබුණු විගණන ඡේද

අමාත්‍යාංශයට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| | විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|---|
| | වර්ෂය | ඡේද අංකය | |
| (අ) | 2016 | 3.7 (ආ) | 2016 රාජ්‍ය වෙසක් උත්සවය පැවැත්වීම සඳහා නයිගල රජමහා විහාරයේ සිදු කරන ලද රු.14,608,026 ක අලුත්වැඩියාවන් සඳහා අදාල කල වැඩ වාර්තා නොතිබූ අතර වියදම් තක්සේරු කර නොතිබුණි. |
| (ආ) | 2015 | 3.9.1(අ) | 2015 වර්ෂයේ ජාතික වෙසක් උත්සවයට සමගාමීව ''බොදු බැති ගීතය'' ක් නිර්මාණය සඳහා රු. මිලියනයක් ගෙවා තිබුණද එම නිර්මාණ කටයුත්ත මේ වන තෙක් සිදුකර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2015 | 3.9.1(ආ) | 2015 වර්ෂය සඳහා බෞද්ධ සංස්කෘතික වටිනාකම හා සම්බන්ධ ප්‍රදර්ශන පැවැත්වීම සඳහා සලසා තිබුණු රු.2,250,000 ක් වූ මුළු ප්‍රතිපාදනයම අනුමැතියකින් තොරව බොදු දිනපොත් මුද්‍රණය කිරීම සඳහා යොදා ගෙන තිබුණි. |
| (ඇ) | 2015 | 3.10.2 | අමාත්‍යාංශය හා එවකට අමාත්‍යාංශය යටතේ තිබූ දෙපාර්තමේන්තු 05 ක් සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කිරීමට 2013 හා 2014 වර්ෂවලදී එකතුව රු.3,807,000 ක් ගෙවා තිබුණි. අමාත්‍යාංශය යටතේ තිබූ දෙපාර්තමේන්තු 5 සඳහා වෙබ් අඩවි සංවර්ධනය කිරීම සඳහා රු.3,003,000 ක් ගෙවා තිබුණද, එම දෙපාර්තමේන්තු සඳහා වෙබ් අඩවි නිර්මාණය කර භාරදී නොතිබුණි. |
| (ඉ) | 2015 | 3.11.3 | 2014 වර්ෂයේ පවත්වන ලද ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමාගේ ජන්ම උත්සවය සැමරීම හා බෞද්ධ සාහිත්‍ය උත්සවය සඳහා සමස්ථ ලංකා බෞද්ධ මහා සම්මේලනය විසින් ඉදිරිපත් කර තිබූ රු.3,189,858 ක වියදම් වාර්තාවක් සඳහාරු.2,000,000 ක මුදලක් බුද්ධශාසන අමාත්‍යාංශය විසින් ගෙවා තිබුණි. විධිමත් පරිදි රු.1,561,264 ක වියදම් සඳහා බිල්පත් ඉදිරිපත් කර තිබුණත් රු.438,736 ක වියදම් වෙනුවෙන් බිල්පත් ලබා ගෙන නොතිබුණි. |
| (ඊ) | 2015 | 3.12.1 | අනුරාධපුර මිරිසවැටිය මහා විහාරයේ භික්ෂු පුහුණු මධ්‍යස්ථානය වටා බැම්ම ඉදිකිරීම සඳහා රු.2,640,792 ක් වැයකර තිබුණද, කාර්ය ආරම්භ කිරීමට පෙර අමාත්‍යාංශය විසින් භූමියේ හිමිකාරත්වය පිළිබඳව සැලකිල්ලක් දක්වා නොතිබීම හේතුවෙන් මෙම කාර්යය අතරමග නවතා තිබුණි. |

.

**2.5 කළමනාකරණ දුර්වලතා**

-----------------------------

නියැදි විගණන පරීක්ෂණ වලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

**(අ) එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර වෙසක් දින සැමරුම - මාධ්‍ය ප්‍රචාරණ කටයුතු**

-------------------------------------------------------------------------------

එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර වෙසක් දින සැමරුමේ මාධ්‍ය ප්‍රචාරණ කටයුතු සඳහා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් සැලසුම් සකස් කොට තිබුණි. ඒ සඳහා මූල්‍ය ප්‍රතිපාදන සැලසීම බුද්ධශාසන අමාත්‍යාංශය විසින් සිදුකර තිබූ අතර රු. මිලියන 20 ක් මෙම අමාත්‍යාංශය විසින් සැලසිනේ රූපවාහිනී ආයතනයට ගෙවා තිබුණි. සැලසිනේ ආයතනය විසින් අතිරේක වැඩ කළ බව දක්වමින් රු.මිලියන 20ට අමතරව තවත් රු.6,985,024 ක් ඉල්ලා සිටීම හේතුවෙන් අදාළ මාධ්‍ය ප්‍රචාරණ කටයුතු අධ්‍යයනය කිරීමේ කමිටුවක් අමාත්‍යාංශ මට්ටමින් ජාත්‍යන්තර වෙසක් දින උත්සවය අවසන් වූ පසුව එනම් 2017 මැයි මස 25 දින දී පත් කර තිබූ අතර එම කමිටුව විසින් රු.මිලියන 20ට සිදුකළ කාර්යයන් පිළිබඳ සමාලෝචනයක් හෝ මාධ්‍ය ප්‍රචාරණ කටයුතු ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් හෝ ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ) කපිල වස්තුපුර ශාක්‍ය ජනපදය ප්‍රතිනිර්මාණය කිරීම**

2016 සැප්තැම්බර් 05 දිනැති අංක අමප/16/1733/730/009 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව බුද්ධශාසන අමාත්‍යාංශය වෙත පවරා දෙනු ලැබූ සමරකෝන් බුදලයට අයත් අක්කර 77 ක භූමි ප්‍රමාණයෙන් යුක්ත පිලියන්දල, කහපොල පිහිටි රෙජිඩේල් වත්ත ඉඩමේ කපිල වස්තුපුර ශාක්‍ය ජනපදය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් බුද්ධශාසන අමාත්‍යාංශය විසින් විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා ලිඛිතව නේපාල රජය දැනුවත් කර එකඟතාවය ලබාගෙන නොතිබූ අතර ශාක්‍ය ජනපදය ප්‍රතිනිර්මාණය සඳහා 2017 මාර්තු මස 03 වන දින පෞද්ගලික සමාගමක් සමඟ ගිවිසුම් අත්සන් කළද 2018 පෙබරවාරි 21 දින වන විටත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන නොතිබුණි.

**(ඇ) දුෂ්කර විහාරස්ථාන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය**

දිස්ත්‍රික්ක 20 සඳහා දුෂ්කර විහාරස්ථාන වැඩි දියුණු කිරීමේ වැඩ සටහන යටතේ ආධාර මුදල් වශයෙන් රු.76,712,741 ක් ලබා දී තිබුණි.කමිටු වාර්තාව නිර්දේශ කර නොතිබූ විහාරස්ථාන 213 ක් සඳහා ආධාර ලබා දී තිබූ අතර දිස්ත්‍රික්ක 17 ක විහාරස්ථාන 204 ක් සඳහා ශක්‍යතා අධ්‍යයන පදනම් කර නොගෙන ආධාර ලබා දී තිබුණි.දිස්ත්‍රික්ක 5 ක අවම ලකුණු ලබාගත් විහාරස්ථාන 9 ක් සඳහා ආධාර ලබා දී තිබුණද උපරිම ලකුණු ලබාගත් දිස්ත්‍රික්ක 16 ක විහාරස්ථාන 81 ක් සඳහා ආධාර ලබාදීමට කටයුතු කර නොතිබුණි.

**(ඈ) රාජ්‍ය වෙසක් උත්සවය - 2017**

වට්ටාරම ශ්‍රී අරහත් මලියදේව විහාරයේ ධර්මශාලාව ඉදිකිරීම සඳහා 2016 හා 2017 වර්ෂ තුළ අවස්ථා 4 කදී අදියර 4ක් සඳහා රු.මිලියන 20 ක් ලබා දී තිබුණි. මෙම රු. මිලියන 20 සඳහා භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් අනුමත කළ ඇස්තමේන්තු, කළ වැඩ වාර්තා, ලබාදුන් ප්‍රතිපාදනවල ප්‍රගති වාර්තා යනාදිය විගණනය සඳහා ඉදිරිපත් නොවූ අතර, යුධ හමුදාව විසින් සිදුකළ මෙම ඉදිකිරීමට අදාළ කාර්යය සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් පසු විපරම් කටයුතු සිදුකර නොතිබුණි.

**(ඉ) මහජනතාව සඳහා සේවා ඉටු කිරීම**

2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 හා 2018 ජනවාරි 24 දිනැති අංක 05/2008(I) දරන රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ චක්‍රලේඛ අනුව සියලුම රාජ්‍ය ආයතන වල පුරවැසි ප්‍රඥප්තිය සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම සිදුකළ යුතුය. එහෙත් අමාත්‍යාංශය විසින් පුරවැසි ප්‍රඥප්තිය සකස්කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.6 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ අමාත්‍යාංශයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 121.74 | 118.25 | 3.50 | 2.87 |
| | මූලධන | 551.55 | 484.96 | 66.59 | 12.07 |
| | **එකතුව** | **673.29** | **603.20** | **70.09** | **10.41** |
| 2014 | පුනරාවර්තන | 170.27 | 169.06 | 1.21 | 0.71 |
| | මූලධන | 494.86 | 485.87 | 8.99 | 1.81 |
| | **එකතුව** | **665.14** | **654.94** | **10.20** | **1.5** |
| 2015 | පුනරාවර්තන | 179.51 | 159.25 | 20.26 | 11.3 |
| | මූලධන | 652.77 | 640.48 | 12.30 | 1.9 |
| | **එකතුව** | **832.28** | **799.73** | **32.55** | **3.9** |
| 2016 | පුනරාවර්තන | 175.02 | 162.73 | 12.29 | 7 |
| | මූලධන | 726.60 | 708.99 | 17.61 | 2 |
| | **එකතුව** | **901.62** | **871.72** | **29.90** | **3** |
| 2017 | පුනරාවර්තන | 130.05 | 127.51 | 2.54 | 1.95 |
| | මූලධන | 36.44 | 30.72 | 5.71 | 15.66 |
| | **එකතුව** | **166.49** | **158.23** | **8.260** | **5** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i) සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම**

වැය විෂයයන් 02 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 125 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් කිසිදු උපයෝජනයක් නොකර මුළුමණින්ම ඉතිරි කර තිබුණි.

**(ii) අධි ප්‍රතිපාදන සලසා තිබීම**

සමාලෝචිත වර්ෂය තුළ පුනරාවර්තන හා ප්‍රාග්ධන වැය විෂයයන් 08 ක් සඳහා වෙන් කර තිබූ රු.679,444,780 ක් වූ ප්‍රතිපාදනයෙන් සියයට 40 සිටසියයට 100 දක්වා වූ පරාසයකට අයත් එකතුව රු.354,327,370 ක් ඉතිරි වී තිබුණි.

**(iii) පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් ප්‍රතිපාදන සලසා ගැනීම**

**------------------------------------------------------------------**

වැය විෂයයයන් 4 ක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මඟින් වෙන් කරවා ගන්නා ලද රු.241,333,586 ක් වූ ප්‍රතිපාදන වර්ෂය තුළ උපයෝජනය කර නොතිබුණි. ඉන් වැය විෂයයන් 3 ක පරිපූරක ප්‍රතිපාදන ඉක්මවා ඉතිරිවීම් නිරීක්ෂණය විය.

**2.7 පොදු තැන්පත් ගිණුම්**

**------------------------**

2017 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.56,938,563 ක් වූ අතර වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.2,256,324 ක් වූ තැන්පතු 05 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.8 බැංකු ගිණුම් මෙහෙයවීම**

**---------------------------**

**ගැලපුම් කළයුතු ශේෂ**

**------------------------**

අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර තිබුණු 2017 දෙසැම්බර් 31 දිනට වන බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව නිකුත් කළ නමුත් බැංකුව වෙත ඉදිරිපත් වී නොතිබුණු එකතුව රු.104,207 ක් වටිනා චෙක්පත් 17 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව ආදායකයා විමසා රාජ්‍ය ආදායමට ගැනීම හෝ නව චෙක්පත් නිකුත් කිරීම කළ යුතු වුවත් එපරිදි කටයුතු කර නොතිබුණි.

**2.9 අනුකූල නොවීම්**

**--------------------**

**නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**-------------------------------------------------**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 66 (2) (අ) ප්‍රකාරව කිසියම් වැඩසටහනක මූලධන වියදම් කොටස ඉන් පිටතට මාරු කළ නොහැකිවුවත් එයට පටහැනිව පූජා භූමි සංවර්ධනය යටතේ වෙන් කරන ලද රු.3,659,932 ක ප්‍රාග්ධන ප්‍රතිපාදන අනුමැතියකින් තොරව විහාරස්ථාන කාර්ය දර්ශන මුද්‍රණය සඳහා රජයේ මුද්‍රණාලය වෙත ලබා දී තිබුණි. විහාරස්ථ කාර්ය දර්ශනය සඳහා වාර්ෂික ඇස්තමේන්තුව මඟින් ප්‍රතිපාදන වෙන් කර නොතිබූ තත්ත්වයන් යටතේ මෙම ගෙවීම් සිදුකර තිබුණි.

**2.10 මානව සම්පත් කළමනාකරණය**

**--------------------------------**

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

**------------------------------------------------------------------------------------**

අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 16 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.124,031 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | ---------------- | --------- | -------------- | --------- |
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 14 | 12 | 02 |
| (ii) | තෘතියික මට්ටම | 02 | 01 | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 139 | 82 | 57 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 46 | 26 | 20 |
| (v) | අනියම්/කොන්ත්‍රාත්/ | 8 | 8 | - |
| | | ----- | ------ | ------- |
| | **එකතුව** | **209** | **129** | **80** |
| | | === | === | === |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 80 ක් පැවති අතර එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට හෝ අවශ්‍ය පරිදි අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීමට පියවර ගෙන නොතිබුණි.